ප්‍රතිපෝෂණ කාර්ය පත්‍රිකා 01

# ක්‍රිස්තියානි ධර්මය



නිපුණතා මට්ටම 1 : 1-2


අ.පො.ස (සාමාන්‍ය පෙළ) උපකාරක කාර්ය පත්‍රිකා

ආගමික හා සාරධර්ම ශාඛාව

අධ්‍යාපන අමාත්‍යංශය

ඉසුරුපාය

බත්තරමුල්ල

**ක්‍රිස්තියානි ධර්මය**

**ආදර්ශ ප්‍රශ්න පත්‍රය 1**

1. දිවැසිවරයා යනු කවුද? දිවැසිවරයාගේ කාර්යභාරය කුමක්ද?

---------------------------------------------------------------------------------------------------------

2. මෙසියස් හා එම්මානුවෙල් යන්නෙහි අර්ථය ලියන්න.

---------------------------------------------------------------------------------------------------------

3. සනඳුරු දේශයේ විසූවන්ට ආලෝකය වූයේ කවුද? සනඳුරු දේශයේ විසූවන් කවරහුද?

---------------------------------------------------------------------------------------------------------

4. පැමිණෙන්නට සිටින තැනැන්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය පිළිබඳව පැහැදිලි කළ දිවැසිවරයා නම් කරන්න.

---------------------------------------------------------------------------------------------------------

5. ජේසුස් වහන්සේගේ රාජ්‍යය තුළ දක්නට ලැබෙන ප්‍රධාන ගුණාංග දෙක ලියන්න.

---------------------------------------------------------------------------------------------------------

6. ජේසුස් වහන්සේ ඊශ්‍රායෙල් හි අධිපතිත්වය දැරීමට පැමිණි බව පවසන දිවැසිවරයා නම් කරන්න.

---------------------------------------------------------------------------------------------------------

7. ස්නාවක ජොහන්ගේ සේවය පිළිබඳ ප්‍රකාශ කළ දිවැසිවරයා නම් කරන්න.

---------------------------------------------------------------------------------------------------------

8. "සියලු මිටියාවත් පුරවනු ලබන්නේ ය. සියලු කඳු හෙල් කපා පහත් කරනු ලබන්නේය." මෙම වදන් පැවසුයේ කවුරුන් විසින් කා පිළිබඳව ද?

---------------------------------------------------------------------------------------------------------

9. "එතුමා කලකිරෙන්නේ වත් අධෛර්ය වන්නේවත් නැත"මෙසේ පැවසුවේ කවුරුන් විසින් කවුරුන් පිළිබඳව ද?

---------------------------------------------------------------------------------------------------------

10. දේව පුත්‍රයාණන් හට මුහුණ දීමට සිදුවන අභියෝග හා ඒවාට උන්වහන්සේ මුහුණ දෙන ආකාරයත් පිළිබඳව දිවැස් වැකි පැවසූයේ  කවුද?

-----------------------------------------------------------------------------------------------

11. "ලෝකයේ පව් දුරු කරන දෙවියන්ගේ බැටළු පෝතකයාණෝ"ලෙස හැඳින්වූයේ කා පිළිබඳවද?

-----------------------------------------------------------------------------------------------

12. දෙවියන් වහන්සේ හා මිනිසා අතර පළුදු වූ දේව සබඳතාවය නැවත ස්ථාපිත කළේ කවුද? කෙලෙසද?

-----------------------------------------------------------------------------------------------

13. ස්වාමීන් වහන්සේගේ මග පිළියෙල කරන්නා ලෙස හැඳින්වූයේ කවුද?

-----------------------------------------------------------------------------------------------

14. ''බොහෝ දෙන ඔහුගේ උත්පත්තිය නිමිත්තෙන් ප්‍රීති වන්නාහ''මෙලෙස පැවසුයේ කවුරුන්ද? කා පිළිබඳවද?

-----------------------------------------------------------------------------------------------

15. මනස්තාපනයේ බෞතිස්මය ලබා දුන්නේ කවුරුන් විසින්ද? කුමන ස්ථානයක දී ද?

-----------------------------------------------------------------------------------------------

16. ජේසුස් වහන්සේගේ හා ස්නාවක ජොහාන්තුමාගේ උපත්වලට අදාළව යහපත් ප්‍රතිචාර දැක්වූ අය නම් කරන්න.

-----------------------------------------------------------------------------------------------

17. දේව සැලැස්ම ඉටු කිරීමට කාලය හෝ වයස බාධාවක් නොවන බව පසක් කර දෙන සිදුවීම කුමක්ද?

-----------------------------------------------------------------------------------------------

18. මරිය තුමිය දේව කැමැත්තට කීකරුව කළ ප්‍රකාශය ලියන්න.

-----------------------------------------------------------------------------------------------

19. මරියතුමිය තම ඥාතී සොහොයුරිය වූ එළිසබෙත් බැහැ දැකීමට පැමිණි අවස්ථාවේ ඇය ප්‍රකාශ කළ වදන් දෙකක් සඳහන් කරන්න.

-----------------------------------------------------------------------------------------------

20. ජේසුස් වහන්සේ බැහැ දැකීමට පැමිණි ශාස්ත්‍රවන්තයන් රැගෙන ආවේ මොනවාද?

-----------------------------------------------------------------------------------------------------------

21. සෙකරියස්ගේ ප්‍රශංසා ගීතයෙන් අවධාරණය කෙරෙන සත්‍යතාවයන් තුනක් සඳහන් කරන්න.

-----------------------------------------------------------------------------------------------------------

22. ලූක් සුභසුනට අනුව දාවිත්ගේ නුවර උපන් ක්‍රිස්තුස් නම් ගැලවුම්කරුගේ සළකුණ ලෙස දෙව්දූතුන් සැල කළේ කුමක්ද?

-----------------------------------------------------------------------------------------------------------

23. විමුක්තිදායකයාණෝ මෙලොවට වැඩිය සුභ ආරංචිය දේවදූතයන් විසින් මුලින්ම දන්වන ලද්දේ කාහටද?

-----------------------------------------------------------------------------------------------------------

24. එදා සමාජය තුළ ප්‍රතික්ෂේපයට හා පීඩනයට ලක් වූ ජන කණ්ඩායම් තුනක් නම් කරන්න.

-----------------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------

25. ජුදා සමාජයේ පැවැති ජුදා ජනතාවට ආවේනික වූ චාරිත්‍ර තුනක් නම් කරන්න.

-----------------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------

26. චර්මචේදන පිළිවෙත තුළින් ජුදෙව් ජනතාව බලාපොරොත්තු වූයේ කුමක්ද?

-----------------------------------------------------------------------------------------------------------

27. ''ජේසුස් ''යන නාමයෙහි අර්ථය ලියන්න. එම නාමය තබන ලද්දේ කුමන අවස්ථාවේදී ද?

------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------

28. ජේසුස් වහන්සේ කැප කිරීම සඳහා රැගෙන ආ අවස්ථාවේදී දේව මාලිගයේ රැඳී සිටි පුද්ගලයින් දෙදෙනා නම් කර ඔවුන් දෙදෙනාගේ ජීවිතවල දක්නට ලැබූ විශේෂත්වයන් පිළිබඳ කරුණක් බැගින් ලියන්න.

------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------

29. ජුදෙව් සමාජය තුළ පිරිමි දරුවන් වැඩිහිටියන් ලෙස පිළිගනු ලබන වයස් සීමාව කුමක්ද? වැඩිහිටි වයසට පත්වූ විට ඔවුන්ට ලැබෙන වරප්‍රසාද මොනවාද?

------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------

30. ''ඔබ මා සෙව්වේ මන්ද මා පියාණන්ගේ මැදුරෙහි සිටිය යුතු බව ඔබ නොදන්නෙහි ද?'' ජේසුස් වහන්සේ කළ මෙම ප්‍රකාශය තුළින් අවධාරණය වන වැදගත් කරුණු දෙකක් ලියන්න.

------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------

**ප්‍රශ්න පත්‍ර 1**

**පිළිතුරු පත්‍ර**

1. දෙවියන් වහන්සේගේ පණිවුඩය මනුෂ්‍යයා වෙත ගෙන එනු ලබන තැනැත්තා
   පාපී වූ මනුෂ්‍යයා දෙවියන් වහන්සේ වෙතට යොමු කිරීම.
2. ආලේපලත් තැනැත්තා / දෙවියන් වහන්සේ අප සමඟයි
3. ජේසුස් වහන්සේ - දිළිඳුන් ,රෝගීන් ,අන්‍ය ජාතීන් , වහලුන්
4. යෙසායා දිවැසිවරයා
5. යුක්තිය හා ධර්මිෂ්ඨකම
6. මීකා දිවැසිවරයා
7. මලාකි දිවැසිවරයා
8. යෙසායා දිවැසිවරයා විසින් ස්නාවක ජොහාන් පිළිබඳව
9. යෙසායා දිවැසිවරයා විසින් ජේසුස් වහන්සේ පිළිබඳව
10. යෙසායා දිවැසිවරයා
11. ජේසුස් වහන්සේ පිළිබඳව
12. ජේසුස් වහන්සේ - කුරුසියේ පූජාව තුළින්
13. ස්නාවක ජොහාන්තුමා
14. සෙකරියස්ගේ ප්‍රශංසා ගීතයේ ස්නාවක ජොහන් පිළිබඳව
15. ස්නාවක ජොහාන් - ජෝර්දාන් ගංගාව අසල
16. මරියතුමිය /ජෝසෙප් /සෙකරියස්
17. එලිසබෙත් වයස්ගතව සිටියදී දරුවකු ලැබීම.
18. බලන්න මම ස්වාමීන් වහන්සේගේ දාසිය වෙමි ඔබ කී ලෙස මට ඉටුවේවා!
19. ඔබ වනිතාවන් අතර ආශිර්වාද ලද්දීය / මාගේ ස්වාමීන් වහන්සේගේ මෑණියන්
20. රන් තුවරලා ගන්ධ රස
21. දෙවි සමිඳානෝ ජනතාවගේ විමුක්තිය සලසන බව
    තම පුත්‍රයාගේ මෙහෙවර වනුයේ ජනතාව මනස්ථාපනයට කැඳවීම බව යි.
    ජේසුස් වහන්සේ අදහගත් අයට පව්කමාවෙන් ගැලවීම ලැබෙන බව
    අන්ධකාරේ හා මරණ සෙවනේ සිටින්නවුන් හට ආලෝකය උදා කරන බව
22. රෙදි වලින් ඔතා ගවයන් කන ඔරුවක බාවා සිටින බිළිඳෙක් ඔබට සම්බ වන්නේය.
23. එඬේරුන්ට
24. දිළිඳුන් / රෝගීන් / අයකැමියන් /එඬේරු/ කාන්තාවන්
25. චර්මචේදන පිළිවෙත , කැපකිරීම, වයස අවුරුදු දොළහේදි පාස්කු මංගල්‍යය සිහිපත් කිරීමට දේව මාලිගයට යාම.
26. දෙවියන් වහන්සේට සන්තක වීම.
27. දෙවියන් වහන්සේ මුදන සේක ,චර්මචේදන පිළිවෙත ඉටු කරන අවස්ථාවේ දී

28. සිමියන් සහ අන්නා ,දේව ගරුබිය ඇතිව යාච්ඤාවෙන් යුක්තව ජීවත් වූ දෙදෙනෙකි.
29. වයසු අවුරුදු දොළහ සම්පූර්ණ වීම - ටෝරාව ඉගෙනීම ,දේව මාලිගයට ඇතුළු වීමට අවස්ථාව ලැබීම
30. ජේසුස් වහන්සේ, දෙවියන් වහන්සේ පියාණන් වහන්සේ බව හඳුනාගෙන එය ප්‍රකාශ කළ බව ජේසුස් වහන්සේ ළමා කාලයේ සිටම දේව රාජ්‍ය මෙහෙවර පිළිබඳව අවබෝධයෙන් යුතුව ක්‍රියා කළ බව